බුද්ධි ප්‍රබෝධගේ මියයෑම සහ මාධ්‍ය වාර්තාකරණයන්

දිවි තොර කරගැනීම් යනු මහජන සෞඛ්‍ය ගැටළුවකි. එහිදී දිවි තොර කරගැනීම් පැතිර යෑමේ ඉඩ අවම කිරීම සඳහා, ඒ සම්බන්ධයෙන් වාර්තා කරනා මාධ්‍ය අතද දැඩි සමාජ වගකීමක් තිබේ.

කෙසේ නමුත්, සමාජ මාධ්‍ය තුළ ද පුළුල් කතාබහට ලක්වූ, බුද්ධි ප්‍රබෝධගේ මරණය සම්බන්ධයෙන් වාර්තා කොට ඇති මාධ්‍ය එම සමාජ වගකීම කෙතරම් බැරෑරුම්ව සලකා තිබේද යන්න ගැටළුවකි.

දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට කිසිසේත්ම අනුකූල නොවන ආකාරයකින් ඇතැම් මාධ්‍ය මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමත්, එම වාර්තාවන් සමාජ මාධ්‍ය ඔස්සේ ද ප්‍රචලිත වීමත්, අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා අනුබල ලබාදිය හැක.

මෙය පර්යේෂකයින් විසින් වර්දර් බලපෑම (Werther effect) ලෙසින් හඳුන්වයි.

එසේම, මිය ගිය අයගේ සමීපතමයින්ට පවා, මෙම මාධ්‍ය හා සමාජ මාධ්‍ය තුළ පළ වන වාර්තාවන්, සිත්වේදනාවන් හා කම්පනයන් ඇති නොකරන්නේ දැයි අප විමසිය යුතුය.

ලෝක සෞඛ්‍ය සංවිධානය, සමාරිටන්ස් ඇතුළු පිළිගත් සංවිධාන මගින්, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන්, මෙම පුවත් හා රූපවාහිනී වාර්තාවන් තුළ උල්ලංඝනය වී ඇති අයුරු මෙසේ පෙන්වා දිය හැක.

එසේ නම්,

1) මෙය වගකීම් සහගත මාධ්‍ය හැසිරීමක් ලෙසින් ඔබ දකින්නේ ද?

2) දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී, මාධ්‍ය සහකම්පනයෙන් යුතුව, මානසික සෞඛ්‍යය සම්බන්ධ කෝණයකින් වාර්තා කිරීමට මාධ්‍ය උත්සුක විය යුතු නොවේද?

උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:

*CCCline - 1333

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(අප්‍රේල් 19, 2023 රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් සහ අප්‍රේල් 19 හා අප්‍රේල් 20, 2023 දින සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් දත්ත ඇසුරිණි. හිරු ටීවී පුවත් විකාශය තුළ දිවි තොර කරගත් අයගේ දේහය බොඳ කරමින් දක්වා තිබුණි.)

# බුද්ධි ප්‍රබෝධගේ මියයෑම සහ මාධ්‍ය වාර්තාකරණයන්

ETHICS EYE
පිටු මායිමෙන් ඔබ්බට

| දිවි තොර කරගැනීමට පෙර ලියු සටහන් පළ කර ඇත. |
| --- |
| දිවයින · දිනමිණ · හිරු TV |
| දිවි තොරකරගැනීම අපරාධයක් ලෙස හඟවන "committed suicide" යන්න සඳහන් කර ඇත. |
| Daily News |
| උපකාරක අංක සඳහන් කර නැත. |
| දිවයින · දිනමිණ · ලංකාදීප · Daily News · හිරු TV |
| දේහයේ ඡායාරූප පළ කර ඇත. |
| දිවයින · හිරු TV |

අප්‍රේල් 19/20, 2023 මෙම සිදුවීම වාර්තා කර තිබූ, රූපවාහිනී පුවත් සහ සිංහල/ඉංග්‍රීසි පුවත්පත් දත්ත ඇසුරිණි.

# බුද්ධි ප්‍රබෝධගේ මියයෑම සහ මාධ්‍ය වාර්තාකරණයන්

ETHICS EYE

| |
|---|
| දිවි තොර කර ගැනීම ප්‍රමුඛතාවයෙන් යුතුව පළ කර ඇත. |
| දිවයින, දිනමිණ, ලංකාදීප, Daily News |
| දිවි තොර කරගත් අයගේ ඡායාරූප පළ කර ඇත. |
| දිවයින, දිනමිණ, TV |
| දිවි තොර කර ගත් ආකාරය සඳහන් කර ඇත. |
| දිවයින, දිනමිණ, ලංකාදීප, TV |

අප්‍රේල් 19/20, 2023 මෙම සිදුවීම වාර්තා කර තිබූ, රූපවාහිනී පුවත් සහ සිංහල/ඉංග්‍රීසි පුවත්පත් දත්ත ඇසුරිණි.

# බුද්ධි ප්‍රබෝධගේ මියයෑම සහ මාධ්‍ය වාර්තාකරණයන්

දිවි තොර කරගැනීමට පෙර ලියු සටහන් පළ කර ඇත.

දිවයින | දිනමිණ | හිරු TV

දිවි තොරකරගැනීම අපරාධයක් ලෙස හඟවන "committed suicide" යන්න සඳහන් කර ඇත.

Daily News

උපකාරක අංක සඳහන් කර නැත.

දිවයින | දිනමිණ | ලංකාදීප | Daily News | හිරු TV

දේහයේ ඡායාරූප පළ කර ඇත.

දිවයින | හිරු TV

අප්‍රේල් 19/20, 2023 මෙම සිදුවීම වාර්තා කර තිබූ, රූපවාහිනී පුවත් සහ සිංහල/ඉංග්‍රීසි පුවත්පත් දත්ත ඇසුරිනි.